# <u>නිවේදනය</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව අනුව **"ත්‍රස්තවාදය වැළැක්වීමේ"** නැමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඉදිරිපත් කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දැන්වීමට කැමැත්තෙමි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123(1) ව්‍යවස්ථාවට අනුව, පනත් කෙටුම්පතෙහි 4(අ), 4(ආ) සහ 68(5) වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාවට අනනුකූල වන බැවින් සහ පනත් කෙටුම්පතෙහි 93(3) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4 වන ව්‍යවස්ථාවන්ට අනනුකූල වන බැවින් සහ එයට පක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට අඩු නොවේ නම් ද, ජනමත විචාරණයකදී එය ජනතාව විසින් අනුමත කොට ඇත්නම් ද පමණක් එය නීතිය බවට පත්වන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කොට ඇත.

එසේ වුවත්, එකී වගන්ති ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යෝජනා කර ඇති පරිදි සංශෝධනය කළහොත් එම අනනුකූලතාවය ඉවත්ව යනු ඇති බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශකර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණය තවදුරටත් තීරණය කර ඇත්තේ පනත් කෙටුම්පතේ අනෙකුත් වගන්ති සරල බහුතරයෙන් සම්මත කළ හැකි බවයි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරමි.